**වර්ෂ 2021 ක්වූ මාර්තු මස 18 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා**

**රැස්වීමේ වාර්තාව**

වේලාව - පෙරවරු 10.00

❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ී රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධර්මසිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. . R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11 W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. W .ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. R.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. කුමාරවේලු කනගරත්නම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24.A.C මොහොමඩ් ෆසාල් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

25. W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26. මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

27. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28. G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30. P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32. H.G සුබද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

33. ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

34. පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්

35. W.M.G.W.C.B වේරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36. M.G උපචන්ද්‍ර ජයපති මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. M.G.R පාලිත අබේරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38. D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39. M.G මොහොමඩ් මුරාඩ් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40. G.A අරුණ ප්‍රසන්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරිම

2021 පෙබරවාරි මස 18 මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 පෙබරවාරි මස 18 මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

<u>**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**</u>

2021 පෙබරවාරි මස 18 මහ සභා වාර්තාව සත්‍ය වාතර්ාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

(1.1)1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් ප්‍රකාශ කිරීමේ පනතට අනුව එක් එක් සභිකවරයා විසින් 10*12 ප්‍රමාණයේ ලිපි කවර භාවිතා කර නියෝජිතයාගේ නම පළාත් පාලන ආයනය සහ වෂර්ය සදහන් කර පළාත් පාලන දෙපාතර්මේන්තුවට එවන ලෙස සදහන් කර ඇති නිවේදනය

(1.2) උඩපළාත ප්‍රාදේශීය සභාවේ එකමුතු ප්‍රගතිශීලි සංධානයේ ගරු වඩිවෙල් රවී මන්ත්‍රීතුමාගේ සභික ධූරය අවසන් කිරිම සම්බන්ධයෙන් එවා ඇති ගැසට් නිවේදනය සභාගත කරන ලදි.

(1.3) මහ සභාවේ ආහාර ද්‍රව්‍ය ප්‍රමිතියකින් තොර නිසා ආහාර සදහා නැවත මිළ කැදවීමක් සිදු කරන බවත් සදහන් කරන ලදි.

(1.4) ජාතික විගණන කායර්ාලයෙන් එවන ලද CLP/KD//F/PS-UP/05 /2020/683( I සිට 6 දක්වා ) ඇති අංක දරන 2021.02.25 දිනැති විගණන විමසුම් වාර්තාව සභාගත කරන ලදි.

(1.5) පළාත් පාලන මැතිවරණ ක්‍රමය සමාලෝචනය සදහා අදහස් සහ යෝජනා යොමු කරන ලෙස සදහන් කර ඇති නිවේදනය ඉදිරිපත් කරමින් මේ සම්පන්ධයෙන් ගරු රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා විසින් පත් කර ඇති කමිටුව පිළිබඳව ඔබගේ පළාත් පාලන ආයතනයේ නියෝජිතයින් දැනුවත් කර දැනට පවත්නා පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව ඔවුන්ගේ අදහස් වෙතොත් කඩිනමින් කමිටුව වෙත යොමු කිරීමට පියවර ගන්නා ලෙස මහ සභාව දැනුවත් කරන ලදි.

(1.6) ප්‍රජා මණ්ඩල පිහිටුවීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ඒ සදහා සිටිය යුතු අවම සාමාජික සංඛ්‍යාව 25ක් බවත් දන්වමින් 2021.02.29 දින පැවති නිවාස සහ ප්‍රජා සංවධර්න කමිටු තීරණ මත පළමු වරට වත්තේහේන,ගලත,මාවතුර කොට්ඨාශ වල ප්‍රජා මණ්ඩල පිහිටුවීම සදහා තීරණය කර ඇති බැවින් ඒ සදහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහය ලබා දෙන ලෙස සදහන් නිවේදනය සභාගත කරන ලදි.

(1.7) 1997-2001 වෂර්වල උඩපළාත ප්‍රාදේශීය සභාව නියෝජනය කල ගරු හිටපු මන්ත්‍රී සුසන්ත මහතාගේ අභාවය පිළිබඳව මහ සභාව දැනුවත් කරමින් ඒ සදහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා සහභාගී වන ලෙස ඉල්ලා සිටින ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න -

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 1(1)

5(1.1) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2020.12.31 අවසන්වූ භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි කමිටුව සදහා සාමාජිකයින් ලෙස ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත්කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.මේ සදහා ගෙවීම් කටයුතු නොකරන බවත් අවශ්‍ය නම් සියළු දෙනා සහභාගී විය හැකි බවත් සදහන් කරන ලදි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2020.12.31 අවසන්වූ භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි කමිටුව සදහා ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා,ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා,ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා, ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ගයානී ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව තීරණය කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 1(2)

5(1.2) පුස්සැල්ලාව නව වැසිකිළි පද්ධතිය ටෙන්ඩර් කලත් කිසිවෙකු ලබාගෙන නොමැති නිසා පැරණි වැසිකිලිය වසා දමා එම ටෙන්ඩකර්රුට නව වැසිකිලිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.පරණ වැසිකිළිය අළුතින් සෑදිය යුතු බවත් එනිසා දැනට ටෙන්ඩර් මගින් පැරණි වැසිකිළිය ලබාගන්නා අයට පොඩි මුදලක් වැඩි කර නව වැසිකිළිය එම අයට ලබාදී පැරණි වැසිකිළිය කඩා ඉවත් කිරීමට කටයුතු කරන බව සදහන් කරන ලදි.

**ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා**

නව වැසිකිළි පද්ධතිය ආරම්භ කල යුතු බවත් එනිසා පැරණි වැසිකිළි පද්ධතිය තාවකාලිකව වසා දමා අළුත්වැඩියා කල යුතු බවත් එතෙක් නව වැසිකිළි පද්ධතිය පැරණි වැසිකිළියේ ටෙන්ඩකර්රුට ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

පුස්සැල්ලාව පැරණි වැසිකිළිය වෙනුවට නව වැසිකිළිය එම ටෙන්ඩර් මිළම වැඩි කර ලබාදීම පිළිබඳව කිව යුත්තේ අපේ පැරණි වැසිකිළිය නිසියාකාරව නඩත්තු නොකර සේවකයින් රු.10-20ක් ලබාගත් බවත් එනිසා වැසිකිළිය අබලන් තත්වයට පත් වූ බවත් පුස්සැල්ලාව නගර ශාලාව ඉදිරිපිට වැසිකිළිය නවීන අංගෝපාංග සහිතව නිමර්ාණය කර ඇති බවත් මේ සඳහා රු.ලක්ෂ 30ක පමණ මුදලක් වැය කර ඇති නිසා මෙහි වැසිකිළියේ තිබෙන උපාංග ආරක්ෂා කර ගත යුතු බවත් ටෙන්ඩර් මුදල ගැන නොව මෙම ස්ථානය රැක බලාගෙන ලබා දෙන තත්වයෙන්ම පවත්වාගෙන යාම කල යුතු බවත් ජලය භාවිතා නොකර පවිත්‍ර කිරීම් නිසියාකාරව නොකලහොත් උපාංග විනාශ වී යන නිසා ලබාගන්නා අයට අවවාද කර අඩුම තරමින් සතියකට වරක්වත් විෂබීජ නාශක යොදා වැසිකිළිය පවිත්‍ර කරන ලෙසට කොන්දේසි දැමිය යුතු බවත් කාමරීක නිළධාරි මහතුන්ගේ අධික්ෂණයෙන් කම්කරුවෙකුට භාරදීම කල යුතු බවත් ඒ ගැන අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

පුස්සැල්ලාව ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් 3 දෙනෙකු සිටින නිසා නිතර පරීක්ෂාවට ලක් කරන ලෙසත් දිනකට දෙවරක් පවිත්‍ර කල යුතු බවත් එනිසා මෙම වැසිකිළිය භාර දෙන විට ඉන්වෙන්ට්‍රියක් සකස් කර ඒ අනුව කාමරීක නිළධාරි මහතෙකු සහ පරිසර නිළධාරි මහතාද එකතුව දින 15කට වරක් පරීක්ෂා කල යුතු බවත් එම වාථර්ා ඔබතුමා ලබාගත යුතු බවත් පවත්වාගෙන යන අය පිරිසිදුවට සිටිය යුතු බවත් තවද රූපවාහිනියක් සවි කල යුතු බවත් තමාද මේ සම්බන්ධයෙන් සොයා බලන බවත් සභාවක් ලෙස භාරදුන් ආකාරයෙන්ම පවත්වාගෙන යන්නේද කියා ලේකම්තුමිය සොයා බැලිය යුතු බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

කොන්දේසි සහිතව බඩු බාහිරාදිය නිවැරදි ලෙස භාරදෙන බවත් පරිසර නිළධාරි මහතා සති 2කට වරක් නිරීක්ෂණය සඳහා යොමු කරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා</u>

මෑතකදී ආරම්භ කරන ලද එළවළු වෙළඳසැල් 2ක් හොඳින් පවත්වාගෙන යන බවත් එම අයට යාමට වැසිකිළියක් පාරදෙක නගරයේ නොමැති බවත් එනිසා තිබෙන වැසිකිළි අළුත්වැඩියා කර සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව තීරණය කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,3)</u>

5(1.3) පුස්තකාල තනතුරු 02 ක් ඇතිකර ගැනීම සඳහා වූ සාධාරණීයකරන වාථර්ාවට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති **අසේල අමරසේන** මහතා</u>

උඩපළාත ප්‍රාදේශීය සභාවට පුස්තකාල 6ක් අපට ඇති බවත් නමුත් ඒවා පවත්වාගෙන යාමට අපට සේවක හිඟයක්පවතින නිසා මෙම සාධාරණීයකරන වාර්තාව පළාත් පාලන දෙපාතර්මේන්තුවට යැවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,4)</u>

5(1.4) උඩපළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මහනුවර මහාධිකරණයේ විභාග වූ අභි අංක 15/20 දරණ නඩුවට පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු වශයෙන් රු.7500.00ක් නීතිඥ යූ.ඒ බෝගහපිටිය මහතාට ගෙවීම සුදුසු බව මම යෝජනා කරමි.

**<u>ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා</u>**

උඩපළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මහනුවර මහාධිකරණයේ විභාග වූ අභි අංක 15/20 දරණ නඩුවට පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු වශයෙන් රු.7500.00ක් නී ඥ යූ.ඒ බෝගහපිටිය මහතාට ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,5)</u>

5(1.5) උඩපළාත ප්‍රාදේශීය සභාව මගින්

1. ප්‍රජා මණ්ඩල පිහිටුවීම ,

2. පෙර පාසල් පාලිකාවන් සඳහා සෞන්දයර් ක්‍රියාකාරකම් වධර්නය කිරීමේ අරමුණින් එක් දින පුහුණු වැඩ සටහනක් පැවැත්වීම ( වැයවන මුදල රු.38000.00 )

3. ඒකාබද්ධ පුස්තකාල කමිටු පිහිටුවීම

4. කාන්තාවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස මැහුම් පාඨමාලාවක් ආරම්භ කිරීම (ඇස්තමේන්තු මුදල රු.80000.00) සුදුසු බව මම යෝජනා කරමි.

**<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය</u>**

පෙරපාසල් ගුරුවරුන්ගේ දැනුම වධර්නය කිරිම සඳහා මේ කටයුතු ඉටු විය යුතු බවත් දරුවෙකු පළමුවෙන්ම පාසලට යාමට පෙර මඟ පෙන්වීමක් ලබාගන්නේ පෙර පාසල තුළින් නිසා ගුරුවරුන් සඳහා පුහුණු වැඩ සටහන් සිදුකිරීම කාලෝචිත බවත් කාන්තාවක් මවක් ලෙස දරුවන්ගේ කටයුතු මෙන්ම ස්වාමියාගේ කටයුතු ඉටු කරන අතර ඇතිවන ආර්ථික අපහසුතා මඟහරවා ගැනීම පිණිස

ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දුනහොත් කාන්තාවන්ට පවුල නඩත්තු කිරීමට හැකියාවක් ලැබෙන නිසා ස්වයං රැකියා පහසුකම් ලබාදීම සුදුසු බවත් එසේම ඒකාබද්ධ පුස්තකාල කමිටු පිහිටුවීම තුළින් යම්කිසි හැකියාවන් වර්ධනය කිරීමක් වැඩිහිටියන්ගේ මෙන්ම දරුවන්ගේද සිදුවන නිසා මෙම යෝජනා සියල්ල මම සතුටින් ස්ථිර කරමි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

මුල් ළමාවිය සංවර්ධනය ලෙස පළාත් සභාවට පෙරපාසල් ගුරුවරුන් යොමු කර ඇති බවත් එනිසා ප්‍රතිපාදන වෙන්කර මෙම කටයුතු සිදුකල හැකිදැයි විමසීමක් සිදු කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

2011 වසරේ පෙර පාසල් සංගමයක් පිහිටුවීම ලංකාවෙන්ම ප්‍රථමයෙන්ම සිදුකලේ උඩපලාත ප්‍රාදේශීය සභාව මඟින් බවත් මීට ප්‍රථම ප්‍රජා සංවර්ධන නිළධාරීතුමා සමඟ එකතුව පුහුණු වැඩසටහන් පැවැත්වූ බවත් සංග්‍රහ කටයුතු සිදුකල බවත් පසුගිය වසර 3ක කාලය තුළ පෙර පාසල් පළාත් සභාවට පවරාගෙන ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට යොමුකර මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධන නිළධාරීන් වෙත ලබාදුන් බවත් නමුත් අපට මුදල් වැය කිරීමේ හැකියාවක් ඇති නිසා මෙම කටයුතු ඉටු කල හැකි බව සඳහන් කරන ලදි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කල බවත් අපට සභාව තුළින් කල යුතු වැඩ රාශියක් ගිලිහී ගොස් ඇති නිසා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම මෙන්ම කාන්තාවන් සඳහා ස්වයං රැකියා අවස්ථාවක් වෙත යොමු කිරීම මෙන්ම ප්‍රදේශයේ පවත්වා ගෙන යන දහම් පාසල් සඳහා යම් සත්කාරයක් කිරීමට අවස්ථාවක් ලබාදෙන ලෙසත් මෙම යෝජනා අතරට දහම් පාසල් සඳහා සත්කාරයක් කිරීමේ යෝජනාව ඇතුළත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,6)</u>

05 (1,6) සී/ස භාරති එයාටෙර්ල් ලංකා සමාගමට අයත් දුරකථන කුළුනක් අංගම්මන ජනපදයේ ඉඩමක ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට 2021.01.06 වන දින ගොඩනැගිලි අයදුම්පතක් මඟින් එම ආයතනය විසින් පෙරසැරි ගාස්තු ලෙස රු.189000.00ක මුදලක් අප වෙත ගෙවූ අතර පසුව එම ඉඩම් කොටස නගර සීමා බල ප්‍රදේශයට අයත් වන්නක් බව අනාවරණය වූ අතර එම පෙරසැරි ගාස්තු මුදල වන රු.189000.00ක මුදල එම ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කීතරී මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,7)

05 (1,7) 252-6339 කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් කරන ලද විමසීමේදී එම රථයට අංගසම්පූර්ණ බොඩියක් සපයා සවි කිරීම සුදුසු බව යාන්ත්‍රික ඉංජිනේරුතුමා විසින් යෝජනා කර ඇති බැවින් එම රථයට අංගසම්පූර්ණ බොඩියක් සපයා සවි කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

වාහනයට අළුතින් බොඩියක් තැබීමට ඉංජිනේරුතුමා දන්වා ඇති බැවින් ලබන සභා වාරයට ඉදිරිපත් කලොත් තව මාසයක් ගත වන නිසා හදිසි යෝජනාවක් ලෙස නවීන තාලයේ සම්පූර්ණ පහසුකම් තිබෙන බොඩියක් 252-6339 කැබ් රථයට යෙදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

252-6339 කැබ් රථයට අළුතින් බදක් ඇතුළත් කිරිම සඳහා යෝජනා වූ බවත් අපි නීත්‍යානුකූලව බදක් සවි කරනවා නම් පුද්ගලිකව ගන්නවා නම් මෝටරරථ දෙපාතර්මේන්තුවට දන්වා අදාළ මුදල් ගෙවා බදක් ගෙන්වා ගත හැකි බවත් මෙරට ආනයනය කරන ලද බදක් තබනවා නම් අපට මෙවැනි කාරණාවකට යා හැකි බවත් තත්වයෙන් වඩාත් සුදුසු ආකාරයේ බදක් තැබීම සුදුසු බවට අදහස් දක්වන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (2,1)

ගරු වයලා විනෝදනී මන්ත්‍රීතුමියගේ යෝජනා

5 (2 .1)දූනුකේඋල්ල මාගර්යේ පාසල් බස් රථයක් ධාවනය නොවීම ළමුන් විශාල පිරිසකට පාසල් කරා යාමට බාධාවක් වී ඇති බවත් එනිසා පාසලට නියමිත වේලාවට යාමට ලැබෙන අවස්ථාව අඩු බවත් උදෑසන ලං.ග.ම බස් රථ කිහිපයක් පෙ.ව 5.30,5.50,6.30 අතර ධාවනය වන බවත් පුද්ගලික බස් රථ 8ක් පමණ ධාවනයේ යෙදෙන බවත් නමුත් දරුවන් පාසල් නොයා නැවත නිවෙස් කරා එන බවත් එනිසා බස් රථ වලින් එක් බස් රථයක් හෝ පාසල් බස් රථයක් ලෙස යොදවා දෙන ලෙසට ගම්පොල ඩිපෝ කළමනාකාරතුමාට දැනුම් දුන්නද පිළිතුරක් නොමැති බවත් දරුවන් ඉඩපාඩු මදි නිසා පා පුවරුවේ පවා ගමන් කරන නිසා දූනුකේඋල්ල මාගර්යට ගම්පොල දක්වා දිවෙන පාසල් බස් රථයක් ලබා දෙන ලෙසට මම යෝජනා කරමි.

ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>**ගරු උදය දිසානායක මන්ත්‍රීතුමා**</u>

මෙම කාලයේ දරුවන් සහ දෙමව්පියන් සියළු දෙනා කාර්යබහුල තත්වයක සිටින නිසා මේ කාලෝචිත යෝජනාව ගම්පොල ඩිපෝ අධිකාරිතුමාටත් දිලුම් අමුණුගම ගරු ඇමතිතුමාට දන්වා යවන

ලෙසත් ඉතාම ඉක්මනින් මෙම යෝජනාවට පිළිතුරක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත් මේ සඳහා විසඳුම් ලබා ගැනීමට මැදිහත් වන බවත් සඳහන් කරන ලදි.

<u>**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**</u>

මෙම යෝජනාව පිළිබඳව මාස 2ක් පුරාවට කථා කල බවත් නමුත් ලං.ග.ම ආයතනය ප්‍රධාන හේතු ලෙස දන්වා සිටින්නේ මහනුවර ප්‍රදේශයට වැඩි බස්රථ ප්‍රමාණයක් යොදවා තිබීම නිසා බස් රථ නොමැති වීම,රියදුරන් සහ කොන්දොස්තරවරුන් නොමැති වීම බවත් උඩගමෙන් හැරවීමට බස් රථයක් ලබා දෙන ලෙස පැවසුව බවත් එනිසා ගරු සභාපතිතුමාගේ ඉල්ලීමක් ලෙස ගම්පොල ඩිපෝ අධිකාරිතුමාට දන්වා සිටින ලෙස පවසන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මෙවැනි යෝජනා ඉදිරිපත් කලත් ගරු ආණ්ඩුකාරතුමා සහ කමිටු සභාපති ලෙස ගරු වසන්ත යාපා බණ්ඩාර මැතිතුමා මේ සම්බන්ධයෙන් කථා කල බවත් සිසුසැරිය බස්රථ තිබෙන නිසා ඉල්ලීමක් කරන බවත් ඒ අනුව ඩිපෝ අධිකාරිතුමාට ගරු ආණ්ඩුකාරතුමාට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් ලිඛිතව සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2,2)</u>

<u>**ගරු වයලා විනෝදනී මන්ත්‍රීතුමියගේ යෝජනා**</u>

5 (2 .2) උඩගම රෝහලට විශාල ගැටළුවක් වී ඇත්තේ මන්ද මානසික රෝගීන් ගෙන ඒමට කටයුතු කරගෙන යාම බවත් ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 8කට මෙම රෝහලෙන් සේවා සපයන බවත් මීට පෙර ගැහැණු පිරිමි වාට්ටු 2ක් තිබූ බවත් එහි නේවාසික රෝගීන් සිටි බවත් ගිලන් රථයක් පවා තිබූ බවත් ජල පහසුකම් සියල්ලක්ම තිබූ බවත් නමුත් දැනට මන්ද මානසික රෝගීන් ගෙන ඒම සඳහා දැල් ගසා කාමර 10ක් පමණ වෙන් කර සකස් කර ඇති බවත් නේවාසික රෝගීන්ගේ වාට්ටු කාමර ලෙස වෙන් කර ඇති බවත් මීට ඉහත දී 2016 වර්ෂයේ ජනතාව උද්ඝෝෂනය කර එම ක්‍රියාවලිය නතර කරගත් බවත් දැනට මහනුවර රෝහලේ සිටින කොරෝනා රෝගීන් රැගෙන එන බව පවසන බවත් මානසික රෝගීන් ගෙන ඒමට අපි විරුද්ධ වන බවත් ගම්වල අසරණ ජනතාවට වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට රු.700-800 වියදම් කර ගම්පොල රෝහල වෙත යාමට සිදු වන බවත් ඉදිරියේදි වෛද්‍ය සායන නේවාසික පහසුකම් නොමැති වන නිසා ගම්මුන් මේ සඳහා දැඩි විරෝධයක් පල කරන බැවින් උඩගම ග්‍රාමීය රෝහලට මන්ද මානසික රෝගීන් ගෙන ඒම නතර කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමා</u>

උඩගම රෝහලට සියළු පහසුකම් තිබූ බව මන්ත්‍රීතුමිය පැවසුවත් මෙම රෝහලට ජල පහසුකම් නොතිබුණු බවත් ගරු සභාපතිතුමා එතුමාගේ වියදමින් රු.80000.00ක පමණ මුදලක් වැය කර හුණුගල විහාරයේ සිට උඩගම රෝහල දක්වා පානීය ජලය ලබාදී ඇති බවත් එක් වෛද්‍යවරයෙක් පමණක් සිටි බැවින් අපි ඇමතිතුමන්ලාට පවසා වෛද්‍යවරයෙක් ලබාගත් බවත් රෝහලේ ඇඳන් සහ ගිලන් රථය පවා පසුගිය රජය කාලයේ රැගෙන ගිය බවත් රෝහල් කමිටුවේ ලේකම් ලෙස

ගමේ ජනතාව සමඟ එකතුව යම් යම් අඩුපාඩු සකස් කරගෙන ඇති බවත් මන්ද මානසික රෝගින් නොව කොරෝනා රෝගීන් ගෙන එනවානම් එයට අප විරුද්ධ නොවන බවත් උඩගම රෝහලට කායර් මණ්ඩලයේ අඩුපාඩුවක් ඇති බවත් ගිය සතියේ සිට නොමිලේ ලේ පරීක්ෂා කිරීම් කරන බවත් මන්ද මානසික රෝගින් ගෙන ඒමට සියළු දෙනා විරුද්ධ බවත් ගමේ අසරණ ජනතාව ඉහළගම සිට ගම්පොල දක්වා යාමට ත්‍රීරෝද රථ සඳහා රු.1000.00 පමණ වියදම් කරන බවත් එනිසා නැවත මෙම රෝහල නගා සිටුවන බව පවසා ඇති බව සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

රෝහල අංගොඩ ලෙසට පත් වීමට ඉඩ නොදෙන බවත් රෝහලට අවශ්‍ය දේ ලබා දී ඇති බවත් උඩගම රෝහලට මන්ද මානසික රෝගින්,කොරෝනා රෝගින්ගෙන ඒමට වයලා මන්ත්‍රීතුමිය හා සමන්ත මන්ත්‍රීතුමා එකතු වී විරුද්ධත්වය එල කල යුතු බවත් ආසනය පුරා සියළු දේශපාලන නායකයින් සංවධර්න කටයුතු ඉටු කර ඇති බවත් මෙම යෝජනාවට අනුව ඔබතුමා ප්‍රධාන පුරවැසියා ලෙස විරෝධතාවය පල කල යුතු බවත් ගැටුම් වාද බේද නොමැතිව ප්‍රදේශයට යම්කිසි හානියක් සිදු වනවා නම් අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කල යුතු බවත් මේ සඳහා තමා සම්පූණර් සහයෝගය ලබාදෙන බවත් සඳහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

අපි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමියට කථා කල බවත් අද උදෑසන මන්ද මානසික පුද්ගලයෙකු රෝහලට ගොස් කොන්ත්‍රාත්කරුවන්ට බැන වැදී වැඩ නතර කරන ලෙස පවසා ඇති බවත් හදිසියේ කොරෝනා රෝගින් ගෙන ආවොත් ඒ සඳහා අවස්ථාව ලබාදිය යුතු බවත් වහුගපිටිය රෝහලට කොරෝනා රෝගින් ගෙන එන බවත් කිසිසේත් මන්ද මානසික රෝගින් මෙම රෝහලට ගෙන එන්නේ නැති බවත් එසේ වුවොත් අපිත් ඒ සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ඔබතුමන්ලා ගැටුම් ඇති කර නොගන්නා ලෙසත් සභාවේ සියළු දෙනාම උඩගම රෝහලට මානසික රෝගීන් ගෙන ඒමට විරුද්ධ බව ලිඛිතව යවන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

**<u>කමර්ාන්ත අනුමැතිය</u>**

**<u>කමර්ාන්ත යෝජනා</u>**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතාගේ යොජනා

(5) (2.3) ලෙවලන් ෆැක්ට්‍රි කොටසේ සුසාන භූමියේ මෘත ශරීර තැබිම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම 500,000.00

(5) (2.4) ලෙවලන් එච්.එම්.කොටසේ පුපුරුස්ස ගලහා මාගර්යට පිවිසෙන අතුරු පාර කොන්ක්‍රිට් කිරිම රු.20000.00 ඉටු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාගේ යෝජනා

(5) (2.5) බ්ලැක්ෆොරස්ට් වාඩිවත්ත ජල පද්ධතිය සංවධර්නය කිරීම රු.700000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස මහර ඔවෙර්ල් වත්ත (අමුණුගම කොටස ) රනිල් වානක මහතාගේ නිවස අසලින් නුවරඑළිය ප්‍රධාන මාගර්යට පිවිසෙන මාගර් කොටසේ අධියරක් පිළිසකර කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා

(5) (2.6) මෛත්‍රි මාවතේ බෝක්කුව ඉදිකිරිම රු.100000.00 සහ ඩාට්‍රි පහල දේවාලය අසලින් ෆැක්ටරිය දෙසට යන මාගර්ය සංවධර්නය කිරිම රු.200000.00 ක කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස

1.මාවුස්සාව කුමාර මහතාගේ නිවස අසලින් මාවුස්සාව ගමට යන පාර කපා සංවධර්නය කිරීම රු.150000.00

2.හල්ඔය නවරත්න මාවත ඉහළ කොටස කපා සංවධර්නය කිරිම රු.150000.00 මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සෙල්වපූනේෂ්වරී මන්ත්‍රීතුමියගේ යෝජනා

(5) (2.7) ස්ටෙලන්බගර් ව්ඩින්හි ආරුමුගන් මහතාගේ නිවස අසලින් යන ජනපද මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00, රුවන්පුර විහාරස්ථානයට යන මාගර්ය සංවධර්නය කිරීම රු.200000.00, ස්ටෙලන්බගර් ව්ඩින්හි පල්ලිය අසලින් යන මාගර්ය සංවධර්නය කිරිම රු.400000.00ක කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස ස්ටෙලන්බගර් වත්තේ සුසාන භූමියේ මෘත ශරීර ගෞරවය සඳහා තැබීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීම රු.200000.00 ස්ටෙලන්බගර් වීඩින්හි මෘත ශරීර ගෞරවය සඳහා තැබීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීම රු.500000.00 ලෙස මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සුභද්‍රා සමරනායක මන්ත්‍රීතුමියගේ යෝජනා

(5) (2.8) හපුගස්පිටිය කඩුගන්නාව මාගර්යේ ශාන්ත මහතාගේ නිවස අසල සිට මාගර්ය සංවධර්නය කිරිම රු.300000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන ලෙස හපුගස්පිටිය ජන කලා කේන්ද්‍රය අසළින් වන වාස විහාරයට යන මාගර්යේ ප්‍රියංකා මහත්මියගේ නිවස අසළ සිට වන වාස විහාරය දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම රු.300000.00 මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරිපත් කර ඇති සංශෝධන කමර්ාන්ත යෝජනා සියල්ල ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභා තීරණයක් අවශ්‍ය බව සඳහන් කරන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

(5) (2.9) ගම්පලවත්ත බුදුමැදුර අසලින් කොබ්බෑවලට යන මාගර්යේ ඇති කාණු පද්ධතිය ආරක්ෂිත කොන්ක්‍රිට් පියන් දමා සංවධර්නය කිරිම හා මාගර්ය සංවධර්නය කිරීම ලෙස සංශෝධනය විය යුතු බව මම යෝජනා කරමි.

ගරු වත්සලා සේනානායක මන්ත්‍රීතුමියගේ

(5) (2.10) පිහිඹියාහේන අතුරු මාගර්ය සංවධර්නය කිරිම කමර්ාන්තය වෙනුවට අලවතුගොඩ නා ගහ අසළ අතුරු මාගර්ය සංවධර්නය කිරීම රු.300000.00ක කමර්ාන්තයද එතුමියගේම රෙට්ටාබෝක්කුව මාගර්ය ගල් තාර දමා සංවධර්නය කිරිම යෝජනාව වෙනුවට රෙට්ටාබෝක්කුව මාගර්ය කොන්ක්‍රිට් කිරීම රු.400000.00 කමර්ාන්තය මම යෝජනා කරමි.

ගරු ඩබ්, ප්‍රේමතිලක මන්ත්‍රීතුමාගේ

(5) (2.11) හල්ඹය හරහා ගල්ඹය අතර ඇතිකුඩා පාලම ඉදිකිරිම රු.20000.00 කමර්ාන්තය වෙනුවට හල්ඹය වටගොඩ අබේවධර්න මහතාගේ වෙලදසැල අසල මාගර්ය සංවධර්නය කිරීමේ යෝජනාවද ඇතුළුව ගරු මන්ත්‍රීතුමලා ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා සියල්ල ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා

එම යෝජනා සියල්ල මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(6) කාරක සභා වාථර්ා *කමිටු වාතර්ා* ඉදිරිපත් කිරීම**

1. .පෙබරවාරි මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා ඉදිරිපත් කිරීම

2. උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව 2021.02.18

3. ගලහා පල්ලේ දෙල්තොට ප්‍රදේශයේ සුසාන භූමියක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පත්කල කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම

4.2021/02/24 දින පරිසර කමිටු වාථර්ාව

5. 2021.02.24 දින කමර්ාන්ත කමිටු වාථර්ාව

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

කමිටු වාර්ථා ඉදිරිපත් කරන අවස්ථාවේ කමර්ාන්ත කමිටුවේ සංක්ෂිප්ත වාර්ථාවක් ඉදිරිපත් කර නොමැති බවත් කමර්ාන්ත කමිටුව අළුත් විදිහට ක්‍රියාත්මක වන බව අපි පැවසූ නමුත් පැවරුම් කමර්ාන්ත යෝජනා පමණක් සදහන් කර ඇති බවත් අදාළ අංශයේ අයට නිවැරදිව මහ සභාවට කමර්ාන්ත කමිටු වාර්ථා ඉදිරිපත් කරන ලෙසට පවසන ලෙසත් කාමරීක නිළධාරි මහතුන්ට කමර්ාන්ත ගැටළු ගැන ණයහිමි කමර්ාන්ත ඉක්මනින් ඉටු කරන්න අපි උපදෙස් දුන් බවත් ගලහා පල්ලේ දෙල්තොට ප්‍රදේශයේ සුසාන භූමිය නිරීක්ෂණයට තමා සහභාගී වූ බවත් නමුත් තමාගේ නම සහ අත්සන වාර්ථාවේ නොමැතිවීම ගැන තමා කනගාටු වන බවත්

සිංහල,මුස්ලිම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු ලෙස තමා සහභාගී වූ බවත් මෙම කමිටුවේදී අපි තීන්දුවක් නොදුන් බවත් අපට තීන්දු දිය නොහැකි බවත් මේ සම්බන්ධයෙන් පරිසර අධිකාරිය දැනුවත් කර තිබෙන යාන්ත්‍රණය අනුව මෙහි තීන්දුව ලබා ගත යුතු බවත්

තවද තමාගේ කොට්ඨාශයේ පාරවල් පවිත්‍ර කිරීමට යනවිට ගරු සභාපතිතුමා තමාව දැනුවත් කරන ලෙස දන්වා තිබුනත් සුපවයිසර් මහතා තමාව දැනුවත් නොකර තමා නොසිටි අවස්ථාවේ පාර පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් විරෝධය පල කරන බවත් ඉදිරියේදී එලෙස කටයුතු නොකරන ලෙසත් ඉල්ලා සිටිමින් ධාවන සටහන් වාර්ථා, මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්ථාව, පරිසර කමිටු වාර්ථාව, අඩුපාඩු ඇතත් කමර්ාන්ත කමිටු වාර්ථාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගලහා පල්ලේ දෙල්තොට ප්‍රදේශයේ සුසාන භූමියක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පත්කල කමිටු වාර්ථාව තමා ප්‍රතික්ෂේප කරන බවත් සදහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

එම යෝජනා සියල්ල මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**(7) ආදායම් වියදම් වාර්ථා ඉදිරිපත් කිරීම -**

2021 ජනවාරි මස ආදායම් වියදම් වාර්ථාව මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2021 ජනවාරි**

| | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| **10** | <u>වරිපනම් හා බදු</u> | | | 1 | වැටුප් හා දීමනා | 4,063,444.74 |
| i | වරිපනම් හා බදු | 240,764.32 | | | | |
| ii | අක්කර බදු | 6,460.00 | | 2 | ගමන් වියදම් | |
| iii | ජල ගාස්තු | 9,734.50 | | | | |
| iV | ව්‍යාපාර බදු | 60,650.00 | 317,608.82 | 3 | සැපයුම් හා උපකරණ | 67,763.00 |
| **20** | <u>කුළී</u> | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| i | ගෙවල් කුළී | 2,375.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | 325,119.90 | | | | |
| iii | පොදු වැසිකිළිය | 22,250.00 | | | | |
| iv | බදු මුදල් | 25,535.00 | | | | |
| v | කුලියට දීම | | 375,279.90 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | |
| i | වෙළඳ බලපත්‍ර | 597,250.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 166,456.47 |
| ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 31,200.00 | 628,450.00 | | | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 393,467.91 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 14,713.22 |
| ii | අය කර ගත හැකි ගාස්තු | 344,244.61 | 737,712.52 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | |
| i | දඩ මුදල් | 183,770.00 | 183,770.00 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 237,108.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | 17,140,559.00 | | | | |
| iV | සේවක ණය පොලී | 47,549.48 | 17,425,216.48 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | - |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | | | | | |
| ii | සාමුහික ආධාර | 60,000.00 | 60,000.00 | | | |
| **80** | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | 10,000.00 |
| i | මූලධන ආධාර | 449,387.47 | 449,387.47 | | සේවක ණය | 1,080,450.00 |
| සේවක ණය | | | 245,377.36 | | ණයහිමි ගෙවීම් | 6,817,381.63 |
| තැන්පත් | | | 480,096.88 | | තැන්පත් | 479,627.52 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | | | 4,339,075.57 | | අතිරික්තය | 12,552,138.42 |
| අත්තිකාරම් පියවීම | | | 10,000.00 | | | |
| අගරු චෙක් | | | - | | | |

ඌණතාවය

| | |
|---|---|
| **25,251,975.00** | **25,251,975.00** |



ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

2021 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව ලැබී ඇති බවත් ජනවාරි මස සමස්ථ ආදායම රු.25,251,975.00 බවත් වියදමට සාපේක්ෂව අතිරික්තයක් ලෙස රු.12,552,138.42 මුදලක් සඳහන් වන බවත් ඒ අනුව වරිපනම් බදු යටතේ රු.240,764.32ද අක්කර බදු රු.6,460.00 බවද ජල ගාස්තු ලෙස රු.9,734.50ද ව්‍යාපාර බදු ලෙස රු.60,650.00ද එකතුව ලෙස රු.317,608.82ද පෙන්වා ඇති බවත් කුළී යටතේ ගෙවල් කුළී,වෙළඳ අයිතිය බදු දීම,පොදු වැසිකිළිය,බදු මුදල්,කුළියට දීම ලෙස රු.375,279.90 ආදායමක් පෙන්වා ඇති බවත් බලපත්‍ර ගාස්තු යටතේ වෙළඳ බලපත්‍ර රු.597,250.02 ද වෙළඳ බලපත්‍ර ත්‍රීරෝද රථ ගාස්තු යටතේ රු.31,200.00ද ආදායම ලෙස රු.628,450.00 මුදලක් උපයා ඇති බවත් සේවා සඳහා ගාස්තු යටතේ ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු රු.393,467.91 ද අයකරගත හැකි ගාස්තු රු.344,244.61ද මේ යටතේ ආදායමට රු.737,712.52ක මුදලක් එකතු වී ඇති බවත් වරෙන්තු හා දඩ යටතේ දඩ මුදල් වශයෙන් රු.183,770.00ක මුදලක් ආදායමට එකතු වී ඇති බවත් වෙනත් ආදායම් යටතේ පොළී,විකුණුම්,මුද්දර ගාස්තු,සේවක ණය පොළී යටතේ රු.17,425,216.68 ආදායමට බැරවී ඇති බවත් මුද්දර ගාස්තු ආදායම ලෙස රු.17,140,559.00 මුදලක් ජනවාරි මාසයට ලැබී ඇති බවත් මෙම ලැබීම සමඟ සභාවට ඉදිරියට කටයුතු කිරීමට අවස්ථාව ලැබෙන බවත් සේවක ණයපොළී යටතේ රු.47,549.48ක මුදලක් සභාව විසින් සේවකයන්ට ණය මුදල් වෙනුවෙන් ලැබී ඇති බවත් ණය වාරික ගෙවීම තුළින් වාරික මුදල මෙන්ම පොළී මුදලක්ද සභාවට ලැබෙන බවත් සඳහන් කරමින් ජනවාරි මස ආදායම් වියදම් වාතර්ාව සම්බන්ධව දීසර් ලෙස පැහැදිලි කිරිම් සිදු කර 2021 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවත් ජනවාරි,පෙබරවාරි ඒකාබද්ධ ආදායම් වියදම් සාරාංශය පිළිගැනීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

සෑම මාසයකම සභාවේ ආදායම් තත්වය සම්බන්ධයෙන් දීසර් ලෙස විග්‍රහ කිරීම ගැන ගරු ශාන්ත මන්ත්‍රීතුමාට සුභ පතන බවත් 2021 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවත් ජනවාරි,පෙබරවාරි ඒකාබද්ධ ආදායම් වියදම් සාරාංශය පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා සියල්ල මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අප්‍රේල් මස මහ සභාව එම මස 9 වන දින පැවැත්වෙන බව සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවන බව දන්වා ඇති ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමා, ගරු ප්‍රේමරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා, ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමාගේ සහ අද දින නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සදහා සභාවට යොමු කරන ලදි.



ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

8. වෙනත්

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

1997-2001 වෂර්වල උඩපළාත ප්‍රාදේශීය සභාව නියෝජනය කල ගරු හිටපු මන්ත්‍රී සුසන්ත මහතාගේ අභාවය පිළිබඳව මහ සභාව දැනුවත් කරමින් ඒ සදහා ශෝකය ප්‍රකාශ කිරීම සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා වෙත අවස්ථාව ලබාදෙන ලදි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

උඩපළාත ප්‍රාදේශීය සභාවේ දෙවරක් අපත් සමඟ කටයුතු කරන ලද සුසන්ත ප්‍රියදශර්න ගරු මන්ත්‍රීතුමා අප අතරින් වෙන්වීම පිළිබඳව උඩපළාත ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවට මෙන්ම මහජන නියෝජිතයින් ලෙස අපටද මහත් පාඩුවක් බවත් එතුමාව තමා ඉතා ලඟින්ම ඇසුරු කල බවත් ඉතා හොද සහෝදර පිරිසක් සිටින උඩපළාත ජනතාවට විශිෂ්ඨ සේවාවක් කරන ලද සුසන්ත මන්ත්‍රීතුමාට අමා මහ නිවන් සුව ප්‍රාථර්නා කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

තමාගේ සාතිශය සංවේගය මෙම අවස්ථාවේ යොමු කරන බවත් දෙවතාවක් සභාව නියෝජනය කරමින් හල්ඔය,ගල්ඔය වසම් තුළ මන්ත්‍රීවරයෙකු ලෙස විශේෂ මෙහෙවරක් කල ජනතා පුත්‍රයෙක් වශයෙන් ප්‍රාදේශීය සභාව තුළ මෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ හොද නම දිනාගෙන කටයුතු කල ජනප්‍රිය පුද්ගලයෙක් ලෙස ගම,පන්සල,ප්‍රජාව සමඟ හොඳින් කටයුතු කල බවත් එනිසා මෙතුමාගේ වියෝව සභාවට මෙන්ම ප්‍රදේශය නියෝජනය කරන ජනතාවට මහත් පාඩුවක් බවත් සදහන් කරමින් එතුමාගේ සහෝදරයින් වෙත ශෝක පණිවුඩය යවන ලෙසට ඉල්ලා සිටින ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

හදිසියේ වියෝ වූ සුසන්ත ප්‍රියදශර්න ගරු මන්ත්‍රීතුමා 1997 ප්‍රාදේශීය සභාව නියෝජනය කල මන්ත්‍රීවරයෙකු බවත් එතුමා තමා සමඟ කළණ මිතුරෙකු ලෙස කටයුතු කල බවත් ලක්ෂිත එතුමාගේ

පුතණුවන් ගියවර ප්‍රාදේශීය සභා ඡන්දයට ඉදිරිපත් වූ බවත් ගල්ඔය ප්‍රදේශයේ විහාරස්ථානය සමඟ එතුමා මෙන්ම පවුලද එක්ව කටයුතු කල බවත් දේශපාලන මතය කෙසේ වෙතත් සියළු දෙනා සමඟ එකමුතුව පක්ෂ භේදයෙන් තොරව අපට ආදශර්මත් ලෙස ජ්‍යෙෂ්ඨ හා නවක මන්ත්‍රීවරු සමඟ සුහදව කටයුතු කල අයෙකු බවත් සදහන් කරමින් පක්ෂයක් ලෙස සමගි ජන බලවේග පකෂයේ ශෝකය එතුමන්ගේ පවුල වෙත යොමු කරන ලදි.



<u>ගරු උදය දිසානායක මන්ත්‍රීතුමා</u>

මේ වන විට සභාපතිතුමාගේ යුතුකම සභාව වෙනුවෙන් ඉටු කරමින් පවතින බව එතුමාගේ පුත්‍රයා සදහන් කල බවත් සුසන්ත මන්ත්‍රීතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු සමඟ දෙවතාවක් සභාව නියෝජනය කරමින් කටයුතු කල බවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පිහිටුවීමේදී එතුමා අපත් සමඟ සියළුම මහජන රැළි සදහා මෙන්ම ශාඛා සමිති පිහිටුවීමේදී ක්‍රියාකාරීව කටයුතු කල බවත් එතුමාට දේශපාලන කටයුතු වලදී ඇති වූ නීතිමය ප්‍රශ්න තුළ ප්‍රාදේශීය සභාව නියෝජනය කිරීමේ අවස්ථාව නොලැබුණ බවත් මෙතුමා බොහොම අහිංසක උත්තරීතර මනුස්සකම තිබෙන උතුම් පුද්ගලයෙක් බවත් අපට එතුමාට උපකාර කිරීමට නොහැකි වීම ගැන කණගාටු වන බවත් 2015 වසරෙන් පසුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙනුවෙන් කටයුතු කල මෙතුමාට අපිත් අජරාමර නිවන්සුව ප්‍රාථර්නා කරන බව සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

2021 මාතර්ු මස මහ සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ප්‍රධාන කළමනාකාර සේවා නිළධාරිතුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් භාෂා පවර්ථර්ක මහතාටත්, ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට දළදා සමිදු පිහිට ප්‍රාථර්නා කරමින් ප.ව.12.00ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම්        සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව        උඩපළාත ප්‍රාදේශීය සභාව